// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1889/27 - 2014 නොවැම්බර් මස 19 වැනි බදාදා - 2014.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 10/3/1/3/63.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2013/එච්ඩබ්ලිව්/445.

මාතලේ ඉළුක්කුඹුර පල්ලේගම මාර්ගයේ අංක 2/8 පාලම (රත්තොට අන්තය) නැවත ඉදිකිරීම සඳහා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාතලේ පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, විහාරගම ග්‍රාම නිලධාරී වසමේ, කුඹුරේගම්මැද්ද ගමේ පිහිටි මාතලේ කොට්ඨාශ භාර ජොෂ්ඨ මැනුම් අධිකාරී විසින් සහතික කරන ලද මා 1632 හා 2014 ජුලි මස 23 දිනැති මූලික පිඹුරේ පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කට්ටිය.

**කැබලි අංක 2**

ඉඩමේ නම: සුදුගගවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: එස්. පී. ද සිල්වා මයා, නදී උයන, කළුදැවල, මාතලේ; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.0020.

**කැබලි අංක 4**

ඉඩමේ නම: සුදුගගවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.0168.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2015 ජනවාරි මස 21 වැනි දින පෙ. ව. 10.00 ට රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2015 ජනවාරි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී. එම්. ජී. බී. විජේබණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
රත්තොට.

2014 නොවැම්බර් මස 15 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 109

1A - G 20631 – 10 - (2014/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.